[සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது]
[All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 10 ශ්‍රේණිය<br>தரம் 10<br>Grade 10 | ඉතිහාසය I පත්‍රය<br>வரலாறு வினாத்தாள்-1<br>History Paper I | පැය එකයි<br>ஒரு மணித்தியாலம்<br>One Hour |

සැලකිය යුතුයි.

I. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සැපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80කි.

II. අංක 1-40 තෙක් ප්‍රශ්න වලට දී ඇති 1,2,3,4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන නිවැරදි පිළිතුර තෝරන්න.

III. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව තෝරාගත් පිළිතුරු අංකයට සැසඳෙන කවය තුළ ⊗ ලකුණ යොදන්න.

---

1) ඉතිහාසය අධ්‍යයනයේදී තොරතුරු වර්ගීකරණයට අනුව ප්‍රධානකොටස් දෙකකි.එනම්
   (i.) පුරාවස්තු මූලාශ්‍ර සහ ශිලා ලිපි මූලාශ්‍ර
   (ii.) ස්මාරක මූලාශ්‍ර සහ පැරණි කාසි මූලාශ්‍ර
   (iii.) ලෙන් ලිපි මූලාශ්‍ර සහ ටැම් ලිපි මූලාශ්‍ර
   (iv.) සාහිත්‍ය මූලාශ්‍ර සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර

2) මහාවිහාර වාසි මහානාම හිමියන් විසින් රචිත මහා වංශයේ අර්ථ විවරණ සඳහා ලියැවී ඇති ග්‍රන්ථය වන්නේ
   (i.) දාඨා වංශය
   (ii.) දීප වංශය
   (iii.) වංසත්ථප්පකාසිනී
   (iv.) ථූප වංශය

3) පහතරට තෙත් කලාපීය ප්‍රදේශයක අතීත මානවයන් විසූ බවට සාක්ෂි ඇත්තේ
   (i.) ඉබ්බන්කටුව
   (ii.) තිස්සමහාරාමය
   (iii.) මිනිහාගල් කන්ද
   (iv.) පාහියන් ගල

4) වර්ෂා කාලයේදී අතීත මානවයාගේ වාසස්ථානය වූයේ
   (i.) ස්වභාවික ගල් ගුහා
   (ii.) ඉලුක් සෙවිලි කළ පැල්පත්ය
   (iii.) විශාල ගස් යට සිටීමය
   (iv.) එළිමහන් පිට්ටනි වලය

5) ප්‍රාග් ඓතිහාසික යුගය යනු
   (i.) ලංකාවේ ලිඛිත ඉතිහාසය ආරම්භ වීමට පෙර යුගය
   (ii.) ලංකාවේ විජයාවතරණයෙන් පසු යුගය
   (iii.) ක්‍රි.ව. 7 වන සියවසෙන් පසු යුගය
   (iv.) මහින්දාගමනයෙන් පසු යුගය

6) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයේ තොරතුරු දැනගත හැකි ස්ථාන කිහිපයක් A,B,C යන ඉංග්‍රීසි අක්ෂර වලින් දක්වා ඇත.එම ස්ථාන අනුපිළිවෙලින් සකස් කළ විට ලැබෙන පිළිතුර කුමක්ද?

(i.) අනුරාධපුරය,පොළොන්නරුව,දඹදෙණිය

(ii.) යාපහුව,කුරුණෑගල ,කෝට්ටේ

(iii.) උඩරංචාමඩම,බෙරලගල,හල්දුම්මුල්ල

(iv.) පාහියංගල,බටදොඹලෙන,බුන්දල




7) පහත සඳහන් (අ)සහ (ආ) තීරු ගලපා නිවැරදි පිළිතුර තෝරන්න

| | (අ)තීරුව | (ආ)තීරුව |
|---|---|---|
| i. | සකස් කර ගත් ගල් පුවරු මත ලියූ ලිපි | A - ගිරිලිපි |
| ii. | ගල්තලාවල හෝ ගල්කුළු මත ලියූ ලිපි | B - ආසන ලිපි |
| iii. | ගුල් ලෙන් වල කටාරම අසල ලියූ ලිපි | C - පුවරු ලිපි |
| iv. | මල් ආසන මත තැබූ ගල් පුවරු මත ලියූ ලිපි | D -ලෙන් ලිපි |

(i.) CADB (ii.) ABCD (iii.) DBCA (iv.) BDAC

8) අතීත ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගවලට ආර්ථික හා තාක්ෂණික දියුණුව පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රයකි.

(i.) නටබුන් (iii.) සෙල්ලිපි

(ii.) වංශ කතා (iv.) කාසි

9) පහත සඳහන් (A)සහ (B) තීරු ගලපා නිවැරදි පිළිතුර තෝරන්න

| | (A)තීරුව | (B)තීරුව |
|---|---|---|
| i. | වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන | A - බෙල්ලන්බැඳිපැලැස්ස |
| ii. | පහතරට වියළි කලාපීය ලෙන් | B - බණ්ඩාරවෙල |
| iii. | තෙත් කලාපීය එළිමහන් වාසස්ථාන | C - බුන්දල |
| iv. | කඳුකර එළිමහන් දඩයම් වාසස්ථාන | D -පොතාන |

(i.) CDAB (ii.) ABCD (iii.) CABD (iv.) DBCA

10) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස පිහිටුවීමේදී වඩාත් සැලකිලිමත් වූ සාධකය වූයේ

(i.) වර්ෂාපතනය (iii.) මෝසම් වර්ෂාව

(ii.) ගංගා වල පිහිටීම (iv.) පසේ සාරවත් බව

The National e-learning Portal for The General Education

11) අතීතයේදී පවා වැඩි දෙනාගේ එකගතාවයෙන් රට පාලනය කිරීමේ අයිතිය ලබාගත් පාලකයකු හැඳින්වූ නාමය වූයේ

(i.) රජ
(ii.) මහාසම්මත
(iii.) මපුරුමුකා
(iv.) පරුමක

12) ගමිකයින්,ගෘහපතීන් අතරින්ම පත්වූ කෙනෙකු බව සඳහන් කෘතිය වූයේ

(i.) ථූපවංශයයි
(ii.) දීප වංශයයි
(iii.) සමන්තපාසාදිකා වයි
(iv.) දළදා සිරිතයි

13) විද්වතුන් සියලු දෙනාගේම අදහස අනුව පරුමකවරුන් බිහිවීම හා දැඩි සබඳතාවයක් ඇත්තේ

(i.) බලය වර්ධනය කර ගැනීමය
(ii.) රජතුමාට හිතවත්කම දැක්වීමය
(iii.) වැව් නඩත්තු කිරීමය
(iv.) විශාල ඉඩම් ප්‍රමාණයකට හිමිකම් පෑමය

14) තමන්ගේ දසවෙනි රාජ වර්ෂයේදී දිවයිනේ ග්‍රාම සීමා සටහන් කිරීම සිදුවූයේ කුමන රජතුමාගේ කාලයේදී-ද?

(i.) පණ්ඩුකාභය
(ii.) වසභ
(iii.) දේවානම්පියතිස්ස
(iv.) මූටසීව

15) පංච කකුධ භාණ්ඩ යනු මොනවාද?

(i.) හෙල්ල,වල්විදූනාව,මීරිවැඩිසහල,මඟුල් කඩුව,දූන්න
(ii.) වල්විදූනාව, මීරිවැඩිසහල,මඟුල් කඩුව, හෙල්ල,නළල් පටිය
(iii.) මඟුල් කඩුව, මීරිවැඩිසහල, වල්විදූනාව, නළල් පටිය,දූන්න
(iv.) වල්විදූනාව,මීරිවැඩිසහල, මඟුල් කඩුව,සේසත,නළල් පටිය

(16) සහ (17) ප්‍රශ්නවලදී A හා B තීරුව නිවැරදිව ගැලපූ විට අදාල පිළිතුර තෝරන්න

16)

| (A)තීරුව | (B)තීරුව |
|---|---|
| i. ශ්‍රී මහා බෝධීන් වහන්සේ රෝපණය කරන අවස්ථාවේ කතරගම හා චන්දනගම ක්ෂත්‍රියන්ට ආරාධනා කිරීම | A - භාතිකාභය රජු |
| ii. මුළු දිවයිනම එක් සේසත් කළ ප්‍රථම පාලකයා | B - වසභ රජු |
| iii. ලාංකික තානාපතිවරයෙකු රෝමයට ගොස් වීදුරු පබළු රැගෙන ඒම | C - දේවානම්පියතිස්ස රජු |
| iv. පරිපාලන දිස්ත්‍රික්ක වෙන්කොට ඒවා පාලනය කිරීමට ඇමතිවරු පත් කිරීම | D - දුටුගැමුණු රජු |
| | E - කාශ්‍යප රජු |

(i.) ABED (ii.) CDBA (iii.) CADB (iv.) CDAB

17)

| (A)තීරුව | (B)තීරුව |
|---|---|
| i. මහසෙන් රජතුමා | A - කාලිංග චක්‍රවර්තී |
| ii. කුටකණ්ණ අභය රජතුමා | B -මින්නේරි දෙවියෝ |
| iii. කාශ්‍යප රජතුමා | C -නරේශ්වර |
| iv. නිශ්ශංකමල්ල රජතුමා | D -ආලකමන්දාධිපති |
| | E -බෝධිසත්ව |

(i.) BCDA (ii.) ABCD (iii.) CDAB (iv.) DABC

18) වර්තමානයේ පාර්ලිමේන්තුව විසින් ඉටු කරන්නා වූ කාර්යය පුරාණ කාලයේදී ඉටු කළ ආයතනය හැඳින්වූ නාමය වූයේ

(i.) ව්‍යවස්ථාදායකය (iii.) රාජසභාව
(ii.) විධායකය (iv.) එක්තැන්සමිය

19) අදාල සිදුවීම හා සෙල්ලිපිය ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ

| A | B |
|---|---|
| i. ඉඩම් පූජාවක නීතිමය කටයුතු ඉටු කිරීමට පැමිණි මහ ලේකම්වරයෙකු පිළිබඳව සඳහන් වීම. | A - කළුදිය පොකුණ |
| ii. නාගදීපය පාලනය කළ සෘෂිගිරි නම් ඇමතිවරයා ගැන සඳහන් වීම. | B - වේගිරිය |
| iii. ක්‍රිස්තු වර්ෂයෙන් නවවන සියවසේ ප්‍රාදේශීය වශයෙන් පරිපාලන මණ්ඩල පිළිබඳව සඳහන් වීම. | C - මැදිරිගිරිය |
| iv. දථික සුමන නම් ඇත්දත් ශිල්පියෙකු ගැන සඳහන් වීම. | D - වල්ලිපුරම් |
| | E - සිතුල්පව්ව |

(i.) ABCD (ii.) CDAB (iii.) BDAC (iv.) ACDB

20) ශ්‍රී ලංකාවේ අතීත පැරණි සමාජය(ක්‍රි.ව.8 සහ 9) චීනය සමඟ සුවිශේෂී විදේශ සම්බන්ධතා පැවැත්වීය.විසි වතාවක් ශ්‍රී ලංකාවෙන් චීනයට රාජ්‍ය තාන්ත්‍රික ගමන් යෙදූනේ කුමන රජතුමාගේ කාලයේදී ද?

(i.) I වන මුගලන් (iii.) I වන විජයබාහු
(ii.) VI වන අග්ගබෝධි (iv.) මහා පරාක්‍රමබාහු

21) පොළොන්නරුවේ පිහිටි දළදා මාලිගයේ ආරක්ෂාව සඳහා වේලෙක්කාර හමුදාවක් යෙද වූ රජතුමා වූයේ

(i.) I වන විජයබාහු රජතුමා (iii.) නිශ්ශංකමල්ල රජතුමා
(ii.) I වන පරාක්‍රමබාහු රජතුමා (iv.) වීර බාහු රජතුමා

22) පුරාණ වෙළඳපොලවල් සංවිධානාත්මකව පාලනය වූ ආකාරය සඳහන් ටැම් ලිපිය වන්නේ

(i.) වල්ලිපුරම්
(ii.) මුතුගල්ල
(iii.) හෝපිටිගම
(iv.) වෙහෙරකෙම

23) ශ්‍රී දන්ත ධාතුව රැගෙන හේමමාලා හා දන්ත කුමරුන් මෙරටට පැමිණි වරාය වූයේ

(i.) ජම්බුකෝලපට්ටන
(ii.) ගෝකණ්ණතිත්ත
(iii.) මහාතිත්ත
(iv.) ලංකාපට්ටන

24) අතීතයේදී "පණ්ණසාලා"ලෙස හැඳින්වූයේ

(i.) පාසල
(ii.) පන්සල
(iii.) මසුන් මරණ තැන
(iv.) රෝහල

25) මාතොට වරාය සමීපව ඉදිකොට තිබෙන හින්දු කෝවිල වන්නේ

(i.) කෝණේෂ්වරම්
(ii.) නල්ලූර්
(iii.) තිරුකේතීශ්වරම්
(iv.) මුන්නේශ්වරම්

26) සමනල කන්ද "ආදම්ගේ කන්ද" ලෙස හැඳින්වූයේ

(i.) බෞද්ධ බැතිමතුන්
(ii.) හින්දු බැතිමතුන්
(iii.) ඉස්ලාම් බැතිමතුන්
(iv.) ක්‍රිස්තියානි බැතිමතුන්

27) අතීත භාවිතාව තුළ "පූගය" ලෙස හැඳින්වූයේ කුමක්ද?

(i.) පාලන මණ්ඩලය
(ii.) නීති විශාරදයන්ගේ සංගම්
(iii.) වෛද්‍ය වෘත්තිකයන්ගේ සංගම්
(iv.) වෙළෙන්දන්ගේ සංවිධානය

28) ප්‍රාග් ඓතිහාසික මානවයා ඉදිකළ ගල්බැම්මකට අයත් කොටස් හමුවන්නේ

(i.) බටදොඹලෙනෙන්
(ii.) පාහියංලෙනෙන්
(iii.) බෙලිලෙනෙන්
(iv.) ඉබ්බන්කටුවෙන්

29) මෙරට වාරි ශිෂ්ඨාචාරය තුළ " දිය කැට පහන" ලෙස හැඳින්වූයේ

(i.) වැව් බැම්මට සම්බන්ධ ගල් ඇතුරු කොටස
(ii.) සොරොව්වට සම්බන්ධ කර තිබූ ගල් කුලුනයි
(iii.) ජලය බෙදා හැරීමට භාවිත කළ වාරි ඇළ
(iv.) වැවට ජලය ලබාගත් ගංගාව

30) මහවැලි ගඟේ අතු ගංගාවක් වූ අඹන් ගඟ හරස් කර ඉදි කළ ඇළහැර ඇළ මගින් ජලය ලබාගත් වැව් වූයේ

(i.) මින්නේරිය,ගිරිතලේ,තිසා වැව,කවුඩුල්ල
(ii.) ගිරිතලේ,කවුඩුල්ල,කන්තලේ,තිසා වැව
(iii.) මින්නේරිය,ගිරිතලේ, කවුඩුල්ල, කන්තලේ
(iv.) ගිරිතලේ, මින්නේරිය, තිසා වැව,කවුඩුල්ල

31. කුට්ටම් පොකුණ,කුමාර පොකුණ,නෙළුම් පොකුණ,ඇත් පොකුණ ඉදිකරනු ලැබුවේ,
(i.) භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා ය.
(ii.) කෘෂිකාර්මික සංවර්ධනය උදෙසාය.
(iii.) බිසෝවරුන්ගේ ප්‍රයෝජනය සඳහාය.
(iv.) නියං සමයකදී ප්‍රයෝජනය සඳහාය.

32. පැරණි කාලයේ කිරිමඩු ශාන්තිකර්මය පැවැත්වූයේ කුමන අරමුණක් උදෙසාද?
(i.) ළමයින්ගේ ආරක්ෂාව සඳහාය.
(ii.) වැඩිහිටියන්ගේ ආරක්ෂාව සඳහාය.
(iii.) කුඹුරුවල ආරක්ෂාව සඳහාය.
(iv.) ගවයින්ගේ ආරක්ෂාව සඳහාය.

33.


පින්තූරයේ දක්වෙන උපකරණ හමුවූයේ කුමන විහාරස්ථානයකින්ද?
(i.) අභයගිරිය (iii.) ආලාහන පිරිවෙන
(ii.) ජේතවනාරාමය (iv.) උත්තරාරාමය

34. එම උපකරණ හමු වූ විහාරස්ථානය පිහිටා ඇත්තේ
(i.) අනුරාධපුරයේ ය (iii.) දඹදෙනියේ ය
(ii.) පොලොන්නරුවේ ය (iv.) යාපහුවේ ය

35. සමාජයේ සිරස් ධූරාවලිය තුල "කුඩීන්" ලෙස හැඳින්වූයේ
(i.) සාමාන්‍ය ජනතාව (iii.) ගුරුවරු
(ii.) වෛද්‍යාවරුන් (iv.) ප්‍රභූන්

36. අතීත සමාජයේ තොරතුරුවලට අදාලව වේවැල්කැටිය සෙල්ලිපියේ සඳහන් වැදගත් කරුණක් වන්නේ,
(i.) උස්බිම්වල කැලෑ නොකැපිය යුතු බව
(ii.) වෙළඳාම පවත්වා ගැනීමට අවශ්‍ය නීති රීති
(iii.) කුඹුරුවල සිටුවිය යුතු නැති භෝග වර්ග දැක්වීම
(iv.) අපරාධ නීතිය සම්බන්ධ තොරතුරු

37. පැරණි සමාජය රාජ්‍ය පාලනය සඳහා කාන්තාවන්ට ද අවස්ථාව ලබා දී තිබේ.මෙරට තෙවරක් ම පාලනය කළ රැජින වූයේ,
   (i.) අනුලා බිසව
   (ii.) කල්‍යාණී බිසව
   (iii.) ලීලාවතී බිසව
   (iv.) ත්‍රිලෝක සුන්දරී බිසව

38. V.O.C යන ඉංග්‍රීසි අකුරු සහිත කාසි මෙරටින් හමු වී තිබේ.එම කාසි අයත් වන්නේ,
   (i.) පෘතුගීසීන්ට
   (ii.) ලන්දේසීන්ට
   (iii.) ඉංග්‍රීසීන්ට
   (iv.) අරාබි ජාතිකයන්

39. ශ්‍රී ලංකාවේ පළමු වන නාගරීකරණය පිළිබිඹු වන්නේ,
   (i.) අනුරාධපුරය හා පොළොන්නරුව මගිනි.
   (ii.) අනුරාධපුරය හා දඹදෙණිය මගිනි.
   (iii.) පොළොන්නරුව හා දඹදෙණිය මගිනි.
   (iv.) අනුරාධපුරය හා මාගම මගිනි.

40. ශ්‍රී ලංකාවේ පැරණි ගම් බිම් බිහිවීමට මූලික කරුණක් වූයේ
   (i.) ආහාර ලබාගැනීමේ පහසුව
   (ii.) දඩයම් ස්ථාන හමුවීම
   (iii.) රතු දුඹුරු පස
   (iv.) ස්ථිරවාසීතාව

(ලකුණු 2X 40=80)

******************

The National e-learning Portal for the General Education

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 10 ශ්‍රේණිය<br>தரம் 10<br>Grade 10 | ඉතිහාසය II පත්‍රය<br>Histopry Paper II | පැය තුනයි.<br>இரண்டு மணித்தியாலங்கள்<br>Three Hours |

- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් කැමති ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 6 කි.

---

## I කොටස

1. ( අ ) (i)පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.

ලංකා පටුන , ඉබ්බන්කටුව , අනුරාධපුර , පොළොන්නරුව , මාගම , එළිහන්ටිපාටිස් , කදම්බ නදී කලා ඔය , ගල්සොහොන්කනත්ත , දඹදෙනිය , යාපහුව , කෝට්ටේ

(ලකුණු 12 )

(ii)පහත සඳහන් ස්ථාන සපයා ඇති ලෝක සිතියමේ ලකුණු කර නම් කරන්න.

පෘතුගාලය,ඕලන්දය,බ්‍රිතාන්‍ය දූපත්,සෞදි අරාබිය,රෝමය ,ඉන්දියාව

(ලකුණු 6)

(ආ ) පහත A හා F දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ ස්ථාන හා නම් අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

A. ගල්පොත සෙල්ලිපිය පිහිටා ඇත්තේ,

B. අශ්ව හිස සහ මිනිසා දැක්වෙන මූර්තිය හමුවන පූජනීය ස්ථානය නම් කරන්න.

C. වළං සාදන්නන් විසූ ගම් අතීත වංස කතාවල හා සෙල්ලිපිවල හඳුන්වන්නේ,

D. ප්‍රාදේශීය පාලනයට සම්බන්ධ වූ කාන්තාවන් හැඳින්වූයේ,

E. දකුණු ඉන්දියාවේ චෛර රාජ්‍යයට විදේශ සංචාරයක නිරත වූ රජතුමා,

F. ධර්මය මතක තබාගත් භික්ෂූන් වහන්සේලා හැඳින්වූයේ,

(ලකුණු 06)

(ඇ) A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



A

1. i.A රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද ?

ii.මෙය හමුවූයේ කුමන ස්ථානයකින් ද?

iii.මෙමගින් පිළිබිඹු වන්නේ කුමක් ද?

(ලකුණු 03)

2.i.~~මෙහි~~ B රූපයෙන් දැක්වෙන්නේ කුමක් ද ?

ii.මෙය කුමන ආගමකට අයත් වේ ද?

iii.එය පිහිටා ඇත්තේ කොහේ ද?



B

(ලකුණු 03)

## II කොටස

1.i.ඉතිහාසය ගොඩනැගීමට සාහිත්‍ය මූලාශ්‍රය යොදා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න. (ලකුණු03)

ii.ඉතිහාසය විෂය අධ්‍යයනයේ දී සාහිත්‍ය මූලාශ්‍රවල ප්‍රයෝජන දෙකක් නම් කරන්න. (ලකුණු 04)

iii.ඉතිහාසය සොයා යන ගමනේ දී කාසි ඉතාමත් වැදගත් මූලාශ්‍රයක් වන බව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii.ඉතිහාසය විෂය ඉගෙනීමෙන් ඔබේ ජීවිතයට ගත හැකි ප්‍රයෝජන තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

2.i.ප්‍රාග් ඓතිහාසික මානවයාගේ වෙරළාශ්‍රිත එළිමහන් වාසස්ථාන තුනක් නම් කරන්න.(ලකුණු 03)

ii.ගල් යුගයේ ජීවත් වූ මානවයාගේ ශාකමය ආහාර වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii.ප්‍රාග් ඓතිහාසික යුගයෙන් මුල් ඓතිහාසික යුගය වෙනස් වන සාධක දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv.පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක තුනක් විස්තර කරන්න.(ලකුණු 06)

3.i.පහත දැක්වෙන වචනවල තේරුම ලියන්න.

i. පරුමක
ii. වැව් ප්‍රපතනය
iii. මපුරුමුතා

(ලකුණු 03)

ii.රාජ්‍යත්වය සම්බන්ධ සංකල්ප හතරක් නම් කරන්න. (ලකුණු 04)

iii.ගමිකයන්ගෙන් ඉටු වූ කාර්යයන් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv.දුටුගැමුණු රජතුමාගෙන් ඉටු වූ දේශපාලන හා ආගමික සේවාවන් දෙකක් විස්තර කරන්න.

(ලකුණු 06)

4.i.ඕනෑම රටක පාලනය මෙහෙයවන ආයතන තුන නම් කරන්න. (ලකුණු 03)

ii.පුරාණ කාලයේ මෙරට පැවති පාලනයේ මූලික අරමුණු මොනවා ද? (ලකුණු 04)

iii.පුරාණ සමාජයේ වාර්ගික සයජීවනය කරුණු දෙකක් ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv.අතීත සමාජයේ ආර්ථික රටාව කරුණු තුනක් ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 06)

5.i.වැවක පහත සඳහන් කොටස්වලින් ඉටුවන කාර්යය අනුපිළිවෙලින් ලියන්න.

i. වැව් බැම්ම
ii. රළපනාව
iii. බිසෝකොටුව

(ලකුණු 03)

ii.පැරණි වෛද්‍ය ශාස්ත්‍රයේ දියුණුව සඳහා සාධක දෙකක් දක්වන්න. (ලකුණු 04)

iii.පූර්ව ඓතිහාසික යුගයේ විද්‍යාවේ පරිණත බව පෙන්නුම් කරන අවස්ථා දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iv."අතීත ශ්‍රී ලාංකිකයෝ ඉතා විශිෂ්ඨ වූ වාරි තාක්ෂණයකට හිමිකම් පෑහ." මෙය කරුණු තුනක් ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 06)

6. i.අතීත සමාජයේ ප්‍රභූත්වයේ ලා සලකන ලද වෘත්තීන් තුනක් නම් කරන්න (ලකුණු 03)

ii. සෙල්ලිපි වල කුඩීන් ලෙස හැඳින්වූ සමාජ පංතිය නියෝජනය කල කණ්ඩායම් හතරක් ලියන්න

(ලකුණු 04)

iii.පැරණි කාලයේ ශ්‍රී ලාංකීය කාන්තාවට සමාජයේ නිසිතැන ලැබුණු බව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න (ලකුණු 05)

iv.යහපත් සමාජයක් පවත්වාගෙන යාමට අතීත සමාජයේ නීතියේ දායකත්වය කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න (ලකුණු 06)

The National e-Learning Portal for The General Education

7. i.ශ්‍රී ලංකාවට බලපෑම් එල්ල වූ දකුණු ඉන්දියාවේ ප්‍රදේශ තුනක් නම් කරන්න (ලකුණු 03)

ii.මහා පරාක්‍රමබාහු රජතුමා වෙළඳ සබඳතා පැවැත්වූ අග්නිදිග ආසියානු රටවල් දෙකක් නම් කරන්න (ලකුණු 04 )

iii.දඹදෙණි යුගයේ ශ්‍රේෂ්ඨ පාලකයා වූ තුන්වන විජයබාහු රජතුමාගේ වැදගත්කම කරුණු දෙකක් ඔස්සේ පැහැදිලි කරන්න (ලකුණු 05)

iv.සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස කෝට්ටේ යුගය හැඳින්වීමට පසුබිම් වන සාධක තුනක් විස්තර කරන්න (ලකුණු 06)

8. i.පොලොන්නරුව පාලනය කල ශ්‍රේෂ්ඨ රජවරුන් තිදෙනා පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 03)

ii.දෙවන නාගරීකරණ ක්‍රියාවලියේ දී බිහිවූ නගර ඊට පෙර පවති නාගරීකරණයෙන් වෙනස් වන ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු04 )

iii.පොලොන්නරුව රාජධානියේ බිඳවැටීමට පසුබිම් වූ සාධක දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv.හයවන පරාක්‍රමබාහු රජතුමාගේ වැදගත්කම කරුණු තුනක් ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 06)

The National e-learning Portal for The General Education

මුස්ලිම් පාසල් සඳහා උපදෙස්

- ❖ මුස්ලිම් පාසල් සිසුන් සඳහා ප්‍රශ්න තෝරා ගැනීමේ දී ප්‍රශ්න අංක 9 , 10 ද තෝරා ගන්න.
- ❖ පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව 06 කි.

9. i.උඩරටවාමඩම කැනීම් මගින් පැරණි නිවසින් හමුවූ ද්‍රව්‍ය තුනක් නම් කරන්න. (ලකුණු 03)

ii.ඉන් අපට එළැඹිය හැකි නිගමන දෙකක් සඳහන් කරන්න. (ලකුණු04 )

iii.ප්‍රාග් ඓතිහාසික මානවයා තම වාසස්ථාන තෝරා ගැනීමේදී සැලැකිලිමත් වූ කරුණු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු05)

iv.අනුරාධපුරය සැලසුම් සහගත නගරයක් බවට පත් කිරීමේදී පණ්ඩුකාභය රජතුමා විසින් සැලැකිලිමත් වූ කරුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු 06)

10. i.වසභ රජතුමාගෙන් ඉටුවූ සේවාවන් තුනක් ලියන්න. (ලකුණු03)

ii.අතීතයේ මෙරට රාජ්‍යත්වයේ උරුමය හිමිවූ ආකාරයන් දෙකක් නම් කරන්න. (ලකුණු04 )

iii.දේවානම්පියතිස්ස රජතුමාගේ සමයේ මෙරට සිදු වූ වැදගත් ආගමික සිදුවීම් දෙකක් දක්වා ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv."මෙරට පාලනය කළ ශ්‍රේෂ්ඨ රජවරු අතර මහා විජයබාහු රජතුමා සුවිශේෂී වේ."එතුමාගෙන් ඉටුවූ දේශපලන සේවාවන් පිලිබඳ කරුණු දෙකක් ඔස්සේ විස්තර කරන්න (ලකුණු 06)

The National e-learning Portal for The General Education



The National e-Learning Portal for The General Education

